# මතුගම අධ්‍යාපන කලාපය

## විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

| 7 ශ්‍රේණිය | ජලයේ ද්‍රාවක ගුණය | ඒකකය - 04 |
|---|---|---|

01. ජලයේ වඩා හොඳින් දියවන ද්‍රව්‍යයක් වන්නේ පහත ඒවායින් කුමක් ද?
1. නිල් කුඩු 2. ලුණු කුඩු 3. වැලි 4. පොල්තෙල්

02. ජීවිතය පවත්වා ගැනීමට බාහිර මාධ්‍යය ලෙස ජලය භාවිතා නොකරන ජීවියා නම් කරන්න.
1. මුහුදු අශ්වයා 2. කැස්බෑවා 3. මිනිසා 4. ඩොල්ෆින්

03. වාහන එන්ජිම සිසිල් කිරීමට ජලය යොදනු ලබන්නේ ජලය කුමන කාර්යයක් ඉටු කරන නිසාද?
1. ද්‍රාවකයක් ලෙස 2. මාධ්‍යයක් ලෙස
3. සන්නායකයක් ලෙස 4. සිසිලන කාරකයක් ලෙස

04. ජලය ඉතා හොඳ ද්‍රාවකයක් ලෙස සැලකිය හැක්කේ,
1. ජලයේ සීනි හොඳින් දියවන නිසාය. 2. මුහුදු ජලයේ හොඳින් ලුණු දිය වී ඇති නිසාය.
3. ජලයේ වායු වර්ග දියවන නිසාය. 4. ජලයේ බොහෝ ද්‍රව්‍ය දියවන නිසාය.

05. ජලයේ දියවන ද්‍රව්‍ය යුගලය තෝරන්න.
1. රබර්, පොලිතීන් 2. සීනි, ඉටි 3. යූරියා, සීනි 4. පොල්තෙල්, යූරියා

06. ජලය ප්‍රයෝජනයට ගන්නා අවස්ථාවක් නොවන්නේ,
1. මිනිස් සිරුර තුළ යූරියා පරිවහනයට 2. මිනිස් සිරුරේ තැවරුණු ග්‍රීස් ඉවත් කිරීමට
3. මිනිස් සිරුර තුළ පෝෂක පරිවහනයට 4. සියලුම ජීවීන්ට ජීව ක්‍රියා පවත්වා ගැනීමට

07. උක් යුෂය පිළිබඳව සත්‍ය වගන්තිය තෝරන්න.
1. ග්ලූකෝස් ද්‍රාවණයකි. ජලය වාෂ්ප කර ග්ලූකෝස් ලබා ගනී.
2. සුක්‍රෝස් ද්‍රාවණයක් ලෙස වාෂ්ප කර සුක්රෝස් සීනි ලබා ගනී.
3. පිෂ්ට ද්‍රාවණයකි. ජලය වාෂ්ප කර පිටි ලබා ගනී.
4. සුක්‍රෝස් ද්‍රාවණයකින් ජලය වාෂ්ප කර ග්ලූකෝස් ලබා ගනී.

08. ජලයේ ද්‍රාවක ගුණය භාවිතයට නොගන්නා අවස්ථාවකි.
1. හකුරු සෑදීම 2. විනාකිරි සෑදීම
3. සේලයින් සෑදිම 4. බැටරි ඇසිඩ් නිෂ්පාදනය

09. ජලයේ දිය වී ඇති දෑ වෙන් කර ගන්නා අවස්ථාවක් නොවන්නේ,
1. ලුණු නිෂ්පාදනය 2. සීනි නිෂ්පාදනය 3. පැණි නිෂ්පාදනය 4. බීම නිෂ්පාදනය

10. ජලජ පරිසරවල ජීවිතය පවත්වා ගන්නා ක්ෂුද්‍ර ජීවියෙක් නොවන්නේ,
1. ඇමීබා 2. පැරමීසියම් 3. ක්ලැමිඩොමොනාස් 4. යීස්ට්

# B කොටස - රචනා

01. වරහන තුළ ඇති සුදුසු වචන යොදා හිස්තැන සම්පූර්ණ කරන්න.

(රුධිරය, යූරියා, සුක්රෝස්, සූර්ය තාපය, ග්ලූකෝස්, උෂ්ණත්ව මානය)

1. මුත්‍රාවල වැඩිපුරම අඩංගු නයිට්‍රජනීය බහිස්‍රාවී ද්‍රව්‍ය .......................................... වේ.
2. ............................................... යනු බීට්වල, උක්වල අඩංගු සීනි විශේෂයකි.
3. ...................................................... උදව් කර ගෙන මුහුදු ජලයෙන් ලුණු වෙන් කර ගනී.
4. මිනිස් සිරුර තුළ ද්‍රව්‍ය පරිවහනයට .................................................. දායක වෙයි.
5. ජලයේ සිසිලන කාරක ගුණය හඳුනා ගැනීමට .................................. යොදා ගත හැක.

02. අනවශ්‍ය වචනය කපා හරින්න.

1. අයිස් කැටයක් අතට ගත් විට සිසිලසක් දැනෙන්නේ (අයිස් කැටයට/අතට) තාපය ගලා යාම නිසා ය.
2. ශාකවලට ඛණිජ ලවණ උරා ගත හැකි වී ඇත්තේ ජලයේ (ද්‍රාවක ගුණය/සිසිලන කාරක ගුණය) නිසා ය.
3. මුහුදු ජලය (වාෂ්පීභවනයට/ඝනීභවනයට) ඉඩ හැරීමෙන් ලුණු ලබා ගත හැක.
4. මත්ස්‍යයින්ගේ ශ්වසනයට අවශ්‍ය වායුව (ජලයෙන්/වායුගෝලයෙන්) ලබා ගනී.
5. ආහාර ජීර්ණය වූ පසු ලැබෙන (පෝෂක/ඔක්සිජන්) දේහය පුරා පරිවහනය කරන්නේ රුධිරය මගිනි.

03. ශීත ප්‍රදේශවල ඇති ජලාශවල දැකිය හැකි අවස්ථාවක් රූපයේ දැක්වේ.




1. මෙහිදී ජලජ ජීවීන්ට ජීවත් වීමට අවශ්‍ය මාධ්‍ය සපයන්නේ කුමන ද්‍රව්‍යය ද?
2. ජලජ ජීවීන්ට ශ්වසනයට අවශ්‍ය වායුව කුමක් ද?
3. ජලජ ජීවීන් එම වායුව ලබා ගන්නේ කුමන පරිසරයෙන් ද?
4. මත්ස්‍යයින්ට ඒ සඳහා ඇති අවයවය කුමක් ද?
5. ජලයේ ජීවත් වන මත්සයෙක්, උරගයෙක්, උභය ජීවියෙක්, ක්ෂිරපායී සතෙකු බැගින් නම් කරන්න.

04. ලුණු ද්‍රාවණයකින් ලුණු වෙන් කර ගැනීමට සැකසූ ඇටවුමක් රූපයේ දැක්වේ.




1. ABC කොටස් නම් කරන්න.
2. මුහුදු ජලයේ වැඩිපුර දිය වී ඇති ලවණය නම් කරන්න.
3. මෙම ක්‍රියාකාරකමෙන් ඔබට ලැබුණු නිරීක්ෂණය කුමක් ද?
4. මුහුදු ජලයෙන් ලුණු වෙන් කර ගන්නා ස්ථානය හඳුන්වන නම කුමක් ද?
5. එහිදී ජලය වාෂ්ප කිරීමට තාපය ලබා දෙන තාප ප්‍රභවය කුමක් ද?
6. මෙලෙසම ජලය වාෂ්ප කර හැරීමෙන් මිනිසා සිදු කරන නිෂ්පාදනයක් නම් කරන්න.
7. ජලයේ දිය වන හා දිය නොවන ද්‍රව්‍යවලට නිදසුන් බැගින් නම් කරන්න.